ඔන්න එකෝමත් එක රටක
කැලෑබද ගම්මානයක හිටියා
හතර දෙනෙකුගේ පවුලක්.
තාත්තායි අම්මායි දෝණියන්දෑයි
ඇගේ ආදරණීය බළල් පැටියායි.

(c) Sumitha Publishers

බළලා තම්ම තඩ්ඩ මහතයි.
ඒ වුණාට දෝණියන්දෑ
ඒ බළලාට කොච්චර ආදරේද කියනවා නම්
බළලා හැම තිස්සෙම ඈ ළඟ
පැදුරක වාඩි වෙලා පුරු පුරු ගගා හිටියා
මීයෙකු ඇහැ ගැහෙන කල්.


(c) Sumitha Publishers

ඒ ගෙදර පුංචියි.
එහි පිළිකන්නෙ තිබුණා
රසවත් කොස් ගෙඩි.
අවුරුද්ද පුරාම එහි ගෙඩි පල ගත්තා.
ගෙදර හැම දෙනාම කැමතියි කොස් කන්ට.